


# සමගින් කාංචනා සඳමාලි දිග ගමනක

විගාමික ශ්‍රී ලාංකික ප්‍රජාව අතරින් බිහිවන කලා නිර්මාණ රස විඳීමේ භාග්‍යය නිතර ලැබෙන්නක් නොවේ. ඉඳ හිට බිහිවන මේ නිර්මාණ සමහර විටෙක හ්‍රී ප්‍රශස්ත මට්ටමේ ඒවා වීම අපේ සතුටට හේතුවෙයි. කාංචනා සඳමාලි ගේ "සඳ කැළුම්" සංගත තැටිය එවන් සතුටක් අපේ සිතේ ඇති කළ නිර්මාණ එකතුවකි.

ගායිකාවක ලෙස ස්ථාවර වන්නට කාංචනා ආ මග කෙටි නැත. ඇය මෙයට කලකට පෙර සිය සහෝදරයා වන සමන්ත වීරරත්න සමග ගැයූ යුග ගී අනාගතයේ දක්ෂ ගායිකාවක වන බවට ඇය අපට පෙන්වා දුන් පෙරමඟ ලකුණු විය.




කාංචනා තමා නිරතවන කලා ක්ෂේත්‍රයේ බැරෑරුම් බව මනා ලෙස වටහා ගත් කලාකාරියකි. හුදු ගායිකාවක වනවා වෙනුවෙට ගායනය පිළිබඳ මනා අධ්‍යයනයක් ලබා ගන්නට ඇය පෙළැඹෙන්නේ ඒ නිසා ය. හෙළයේ මහා සංගීතඥයකු වන ෂෙල්ටන් ප්‍රේමරත්න ශූරීන් වෙතින් ගායනය හදාරන්නට ඇය ලද භාග්‍යය ඇගේ ගමන් මඟට වැටුණ ස්වර්ණාලෝකයක් වන්නට ඇති බව නිසැක ය.

පසුගිය දා එළිදැක්වුණ කාංචනා ගේ "සඳ කැළුම්" සංගත තැටිය නැවුම් ගී 17 ක එකතුවකි. කපිල කුමාර කාලිංග, ටියුඩර් අමරසේන, ප්‍රනීත් අබේසුන්දර, ඩබ්ලිව් ජයසිරි, පුෂ්පා රම්ලනී රත්නායක, රත්න ශ්‍රී විජේසිංහ, සුමුදු වෙත්තසිංහ, කුසල් බී සේනාධීර, රවි සිරිවර්ධන, රූපා ශ්‍රියානි ඒකනායක, මුතුමල් පෙරේරා, රයිනි කුරුකුලසූරිය යන ගී පද රචකයන්/රචිකාවියන් අතින් ගී ලියැවී ඇති මේ සංගත තැටියට රෝහණ වීරසිංහ, ඉන්ද්‍රජිත් මිරිහාන, මහින්ද බණ්ඩාර, නවරත්න ගමගේ, අග්‍රා ප්‍රේමරත්න, තරුපති මුණසිංහ, මහානාම වික්‍රමසිංහ, ලක්ෂ්මන් විජේසේකර යන ප්‍රතිභාසම්පන්න සංගීතඥයන්ගේ සංගීතයෙන් ඔප ගැන්වී ඇත,

තමන්ගේ සංගත තැටිය සඳහා එකිනෙකට වෙනස් තේමා සහිත පදවැල් තෝරා ගන්නට කාංචනා සමත් වීම වැදගත් ය, මනා සංයමයකින් හා කැපවීමකින් සිය කටහඬින් මේ පදවැල් සරසන්නට කාංචනා සමත් වී ඇත, මේ ගී අතරට එක් කර ඇති ජය ශ්‍රී චන්ද්‍රජිත් සමග ගායනා කරන ලද නාඩගම් ගීය ද අපූරු ය,

කාංචනා ගායිකාවක ලෙස ඉතා සාර්ථක ගමනක් යන්නට පා ඔසවා ඇති බව ඇගේ කුළුඳුල් සංගත තැටිය අපට පෙන්වා දෙයි, ඇගේ ගමන පැහැදිළිය, ඒ මගෙහි යන්නට ඇයට අපේ සුබ පැතුම් මෙලෙස එක් කරමු,

ජගත් ජේ එදිරිසිංහ

Great Opportunity...!
No Sponsorship
CHINA
M.B.B.S Students
CAN STUDY IN WORLD RECOGNIZED
NANJING MEDICAL UNIVERSITY
• In English Medium
• W.H.O & Sri Lanka Medical Council Approved
• Low Tuition Fees
• After MBBS can study MD in Australia/ UK/ USA
DZ Ads
Ten(10) Scholarships
for each intake for the whole study period
Accommodation - University Hostel
Contact
A.H Godavitarane
Former Principal - Rahula College - Matara
EXCEL AUSTRALIAN EDUCATION CENTER
432 1/3, Pannipitiya Road, Pelawatta, Battaramulla.
(Opposite Isurupaya Education Ministry)
Tel:00 11 94 713 005 216
Email: info@eaec.com.au

8 වන පිටෙන්

විය. ශබ්ද පරිපාලනය සඳහා ලලිත් අරුණශාන්ත ඉදිරිපත් වූ අතර ඔහු සතුව ඇති ශබ්ද පරිපාලන මෙවලම්, මයික්‍රෆෝන්, විකාශන යන්ත්‍ර සියල්ල සැපයීමට ද එකඟ විය. ජයන්ත සමරක්කොඩි ද ඊට එක් වූ අතර අවශ්‍ය විටෙක සංගීත වාදන තීරු පථ වාදනය කිරීම සඳහා ඔහුගේ විදුලි සර පුවරුව ද රැගෙන ඊමට එකඟ විය.

මෙලෙසින් වසර 2012 ජූනි මස දහසය වන දින පැවත්වුණ සාකච්ඡාවන්ට අනුව එම වසරේ ජූලි 14 වන දා හවස හතට වරමොන්ට් සවුත් හි කරෝබ්‍රාන් ඩ්‍රයිව් හි අංක එක දරන ස්ථානයේ ඇති ප්‍රජා ශාලාවේදී ප්‍රථම "ආරාධනා" සංගීත කවය පැවැත් විණ. ඊට අමතරව පැමිණ සිටියවුන්ගෙන් ලලිත් අරුණ ශාන්ත ඉල්ලීම් දෙකක් කරන ලදී. පළමුවැන්න එම ශාලාව තුල මත් පැන් පානයෙන් වළකින ලෙසයි. දෙවැන්න යමෙක් ගායනය කරන අතරතුරදී තම තමන්ගේ අවධානය ගායකයා වෙත යොමු කිරීමට කාරුණික වන ලෙසයි.

ජයන්ත සමරක්කොඩි සතුව ඇති සංගීත වාදන තීරු පථ (Music Tracks) මෙන්ම පදමාලා එකතුවද කුමටම ප්‍රයෝජනවත් විය. මුල් දිනයේ නිවේදන කටයුතු කළ නිමල් ඒකනායක "ආරාධනා" පිළිබඳව හඳුන්වා දීමද පිළිපැදිය යුතු දේ ද මැනැවින් පැහැදිලි කළේය. සිසර දිසානායක හට ලාංඡනයක් නිර්මාණය කිරීමට පැවරිණ. සැබැවින් ම මුල් ම "ආරාධනා" මියැසි හමුව ඉතා සාර්ථක විය.

මෙලෙසින් ඇරඹුන "ආරාධනා" වෙත පසුව තව තවත් පිරිස් එක් වූහ. ඒ අතර දරුවන්ගේ ඉදිරිපත් වීම් වැදගත් විය. සබ කෝලය මඟහරවා ගැනීමට "ආරාධනා" ඔවුන්ට කදිම තෝතැන්නක් විය. සිංහල ගීත මතු නොව හින්දි ගීත මෙන්ම දෙමළ ගීත පවා ගායනය වූ අතර, ශ්‍රී ලංකාවේ දෙමළ හා ඉන්දියානු සම්භවයක් ඇතියවුන් ද "ආරාධනා" හමුවට එක් වූහ.

මේ වන විට නගරයේ බටහිර ප්‍රදේශයේ ද " ආරාධනා" හමුවක් ඩඩ්ලි හා ලලිතා දෙපළ විසින් සංවිධානය කරනු ලැබේ. එය පැවැත්වෙන්නේ මාසයේ සෑම දෙවන සෙනසුරාදා රාත්‍රියේදීයි. ඒ අනුව "ආරාධනා" හමුව මසකට දෙවරක් නගරයෙ බටහිර හා නැගෙනහිර ප්‍රදේශවල වෙන වෙන ම සංවිධානය කෙරෙ යි. සහභාගි වන්නන්ගේ උනන්දුව හා ඉල්ලීම අනුවයි ඒ.

පසුගිය මාසයේ සෙන්ට් ඕල්බන්ස් ප්‍රදේශයේ පැවැත්වුණ හමුව අප කා හටත් විශේෂ හමුවක් විය. මව් බිමෙන් මෙහි පැමිණ සිටින විශිෂ්ඨ වයලින් වාද්‍ය ශිල්පියෙකු මෙන්ම ගායන ශිල්පියෙකුද වන ඩී. ඩී. ගුණසේන මහත්මා ආරාධිතයෙකු ලෙස සහභාගි වීමා නිසයි, ඒ. ගුණසේන මහත්මා එකල වයලින් වාදන කිහිපයකින් ද සිංහල හා හින්දි ගී ගායන කීපයකින් ද පැමණ සිටියවුන් පිණවීය. ඔහුට තබ්ලා වාදනයෙන් දායක වූයේ අරෝෂ ජයවර්ධන සොහොයුරායි. අන් අයගේ ගායනයන්ට ද වයලීනයෙන් දායක වීමට ගුණසේනයන් කාරුණික වීය.

පන් ලියවිල්ල හමාර කළා. පන්, පින්, පැන් තුන්දෙනාම දැන් "ආරාධනා" හමුවේ සාමාජිකයෝ. ගුණසේන මහත්තයා ආව දවසේ ගායනා කරන්න පන් තෝරගත්තේ අමරදේව මහත්තයා ගායනා කරපු "සිනිදු සුදු මුතු තලාවේ", ගීතයයි, "මා මළ පසු සොහොන් කොතේ" ගීතයයි. ඒ ගුණසේන මහත්තයාට තමන්ගේ වයලින් වාදනවලින් ශිල්ප පෙන්නන්න අවස්ථාව දෙන්නයි ඒ සින්දු තෝරාගත්තේ. "සිනිදු සුදු මුතු" ගීතයේ වාදන කොටස් ගුණසේන මහත්තයා වයලීනයෙන් අපූරුවට වාදනය කළා. අරෝෂන් අගේට සහය වුණා. "මා මළ පසු" ගීතයට ගුණසේන මහත්තයා සහය වුනේ සර්පිනාවෙන්. මේ ගීත දෙකේම පද ලිව්වේ මහගම සේකර මහත්තයා සංගීතය සෝමදාස ඇල්විටිගල මහත්තයාගෙන්. පන් ඒ අය ගැන මතක් කළා.

කිසිම පුහුණුවක් නැතිව එවෙලේම කරන මේ ගායනා වල අඩු පාඩුකම් හරියට ඇති. ඒ වගේම එක එක අයගේ හැකියාවල් වෙනස්. උනන්දුවක් තියෙන අය, දන්න අයගෙන් අහගෙන පුළුවන් තරම් තමන්ගේ අඩුපාඩු හදා ගනීවි. ඒත් හැමදාම තමන්ට ගායනා කරන්න බෑ කියලා හිතින් විඳව විඳවා ඉන්නවාට වැඩිය තමන්ට පුලුවන් හැටියට ගායනා කරන්න ඉදිරිපත්වෙලා ඒ සතුට විඳින එක හොඳ දෙයක්." පින්සල පන්හිඳගේ ලියවිල්ලට ඌන පූර්ණයක් එක් කළා.

"ඔව් ජීවිතය තියෙන්නේ විඳවන්න නෙවි, විඳගන්න....." පන් ආයෙමත් පණ්ඩිත වාක්‍යයක් එකතු කළා.."